# බලහත්කාරයෙන් අතුරුදහන් කල වින්දිතයන්ගේ 2023 ජාත්‍යන්තර දිනය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරක විසින් කරන ලද ප්‍රකාශය

කොළඹ, 2023 අගෝස්තු 30

බලහත්කාරයෙන් අතුරුදහන් කල වින්දිතයන්ගේ ජාත්‍යන්තර දිනය ලොවම සනිටුහන් කරන මේ මොහොතේ, අප සිතුවිලි මෙම සාහසික අපරාධයට ගොදුරු වූවන් සහ තම ආදරණීයයන්ගේ ඉරණම නොදැන පීඩා විඳින්නන් වෙත යොමු වේ. වසර ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකාව තුළ දිවයින පුරා බොහෝ පවුල් සහ ප්‍රජාවන් පෙළන ලද වේදනා සහ අවිනිශ්චිතතාවයන් මෙන්ම පිළිතුරු නොමැති ප්‍රශ්නවල සෙවනැල්ලක ජීවත් වීමට බලකෙරුණු මෙම දිනය ගැඹුරින් අනු නාද වෙයි.

බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් ජාතියේ ඉතිහාසයට වේදනාකාරී කැළලක් ඉතිරි කර ඇති අතර, ඔවුන්ගේ ආදරණීයයන් ජීවත්වන හෝ නිශ්චිතවම නොසිටින දෙගිඩියාවක දහස් ගණන් ශ්‍රී ලාංකිකයන්ගේ ජීවිත හැඩගස්වමින් පවතියි. පසුගිය දශකය පුරා පැවතුනු මඳ ප්‍රගතිය සමගින්, ශ්‍රී ලංකාවේ පවුල් තම ආදරණීයයන්ගේ ඉරණම සහ සිටින ස්ථානය දැන ගැනීමට වඩා වෙහෙසවෙති. පිළිතුරු සෙවීම සඳහා වන ඔවුන්ගේ නොපසුබස්නා උත්සාහය බොහෝ විට ඔවුන් තවදුරටත් ගොදුරු බවටත් බිය ගැන්වීම, අපකීර්තිය සහ කොන් කිරීම් වලටත් ලක් කරයි.

සිදුවූ බලහත්කාර අතුරුදහන්වීම් පිළිබඳ ආමන්ත්‍රණය කිරීම සඳහා මෑත වසරවලදී, ශ්‍රී ලංකාව වැදගත් පියවර ගෙන ඇත. 2015 බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් වලින් සියළු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය අත්සන් කිරීම, අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය (OMP) පිහිටුවීම තවත් සන්ධිස්ථාන විය. OMP විසින් ලැබී ඇති සහ ප්‍රකාශයට පත් කරන ලද "සොයා ගත නොහැකි සහ අතුරුදහන් වූ පුද්ගලයන් සම්බන්ධ පැමිණිලි සහ තොරතුරු ලැයිස්තුව" යුක්තිය ඉටුකිරීමේ ප්‍රගතිය මනින පදනමක් ලෙස ක්‍රියාකර ඇත.

එහෙත්, සත්‍යය, යුක්තිය සහ හානි පූරණය සඳහා වින්දිතයාගේ අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා බොහෝ දේ කළ යුතුව තිබේ. වින්දිතයන්ගේ ඉරණම හෝ සිටින ස්ථානය සොයා බැලීමටත්, විපතට පත් වූවන්ට හානි පූරණ ලබා දීමටත්, අපරාධකරුවන් වගවීම සඳහාත් ගන්නා උත්සාහයන් වේගවත් කරන ලෙස අපි බලධාරීන්ගෙන් ඉල්ලා සිටිමු. සත්‍යය තහවුරු කිරීම වින්දිතයින්ට, දිවි ගලවා ගත් අයට සහ පවුල්වලට මෙන්ම සමස්ත සමාජයටද අත්‍යවශ්‍ය වේ, මන්ද සත්‍යය තුළින් සුවය ආරම්භ වන අතර සංහිඳියා ක්‍රියාවලිය දියත් කළ හැකිය.

එක්සත් ජාතීන් බලහත්කාරයෙන් අතුරුදහන් කල වින්දිතයන් සහ පවුල් වෙත සහයෝගය දක්වන අතර සත්‍යය, යුක්තිය සහ හානි පූරණය සඳහා වන ඔවුන්ගේ අරගලයේදී බලහත්කාරයෙන් අතුරුදහන් කල වින්දිතයින්ගේ ඥාතීන්ට සිය සහයෝගය නැවත අවධාරණය කරයි.

අපි මෙම දිනය සනිටුහන් කරන විට, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් අතීතයේ නෂ්ටාවශේෂ බවට පත් කිරීම සහතික කිරීම සඳහා අපගේ කැපවීම අලුත් කරමු. වින්දිතයන්ගේ අයිතීන් වෙනුවෙන් පෙනී සිටිමු, යුක්තියේ මූලධර්ම සුරකිමු, අවිනිශ්චිතතාවයේ ග්‍රහණයේ පසුවන කිසිදු පවුලක් අත් හැර නොයන අනාගතයක් ගොඩනගමු. මීට විසඳුමක් සෙවීම යුක්තිය පිළිබඳ කාරණයක් පමණක් නොව ශ්‍රී ලංකාව ප්‍රගතියේ සහ තිරසර සංවර්ධනයේ මාවතට යොමු කිරීමට අත්‍යවශ්‍ය පදනමකි.

ස්තූතියි